SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර III විභාගය - 2025 ජූලි

## යෝජිත උත්තර

# (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය (CPT)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

## යෝජිත උත්තර

(මුළු ලකුණු 20) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :***

**පරිච්ඡේදය 01 - ශ්‍රී ලංකාවේ බදුකරණය හැඳින්වීම**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 69 (1) වගන්තියට අනුව, පුද්ගලයෙකු තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු ලෙස සැලකෙන්නේ එම පුද්ගලයා:

a. ශ්‍රී ලංකාව තුළ වාසය කරයි නම්;
b. එම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුළ දී දින එකසිය අසූතුන (183) ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්;
c. එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයකු හෝ නිලධරයකු වේ නම් සහ එම පුද්ගලයාගේ කාලාත්‍රයා එම වර්ෂය තුළ විදේශයක ඇත්නම්; හෝ
d. වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ,

(a) දී ඇති සිද්ධියට අනුව, ඉන්දික මහතා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වුවද 2020 සිට පකිස්ථානයේ සේවය කර ඇත. ඔහු 2024 ජූලි 06 වන දින ශ්‍රී ලංකාවට පැමිණ 2024 ඔක්තෝබර් 14 වන දින පිටත්ව ගියේය. එම කාලය තුළ, ඔහු ශ්‍රී ලංකාව තුල කායික සිටියේ දින 101 ක් පමණි. 2024/25 තක්සේරු වර්ෂය තුළ ආරම්භ වන ඕනෑම මාස දොළහක කාල පරිච්ඡේදයක් තුළ ශ්‍රී ලංකාව තුල කායික වශයෙන් සිටි මුළු දින ගණන 101 කි. ඒ අනුව, 69(1) (ආ) වගන්තියට අනුව, ඔහු ශ්‍රී ලංකාවේ දින 183 කට වඩා අඩු කාලයක් සිට ඇති බැවින් 2024/2025 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා ශ්‍රී ලංකාවේ නිර්වාසිකයෙකි.

(b) දී ඇති සිද්ධියට අනුව, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන මාලා මහත්මිය, ගණකාධිකාරීවරියක් ලෙස සේවය කිරීම සඳහා වසර දෙකක ගිවිසුම් කාලයක් සඳහා 2025 ජනවාරි 05 වන දින සෞදි අරාබියට සංක්‍රමණය වේ. 2024 අප්‍රේල් 01 සිට 2025 ජනවාරි 05 දක්වා එම කාලය තුළ ඇය ශ්‍රී ලංකාවේ කායික වශයෙන් දින 280 ක් සිට ඇත. 2024/25 තක්සේරු වර්ෂය තුළ ආරම්භ වන ඕනෑම මාස දොළහක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ කායික වශයෙන් සිටි මුළු දින ගණන 280 කි. ඒ

අනුව, 69(1) (ආ) වගන්තියට අනුව ඇය ශ්‍රී ලංකාවේ දින 183 කට වඩා ගත කර ඇති බැවින් 2024/2025 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකි.

***(මුළු ලකුණු 05)***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 07 - වෙනත් ව්‍යාපාර බදු**

**(a)**

| | |
|---|---|
| **වින් (පෞද්ගලික) සමාගම.** | |
| **2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා** | |
| **ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගණනය කිරීම** | |
| | **රු.** |
| කාර්තුව සඳහා පිරිවැටුම | 200,250,000 |
| බද්දට යටත් පිරිවැටුම (200,250,000 x 85%) | 170,212,500 |
| **ගෙවිය යුතු ස.ආ.දා.බ @ 2.5%** | **4,255,313** |

***(ලකුණු 03)***

**(b)** මුද්දර ගාස්තු පහත සඳහන් ක්‍රමවේදයෙන් ඔස්සේ පියවිය හැකිය, (2008 අංක 10 දරන පනත මගින් සංශෝධනය කරන ලද පරිදි)

- ආදායම් මුද්දර ඇලවීම
- බැංකුවට සෘජු ගෙවීම
- මුද්දර ගාස්තුව සමතයකට පත් කිරීම ***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

## *තෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 06 - බදු සම්බන්ධ නඩු තීන්දු**

රවී විසින් කැබලි කල ඉඩම් කොටස් විකිණීමෙන් උපයන ලද ලාභය ආදායම් බද්දට යටත් වේ, මන්ද එය වෙළඳාමේ ස්වභාවයේ වික්‍රමාන්විත ක්‍රියාව මත ලැබෙන ආදායමකි. Ram Iswara එදිරිව දේශීය ආදායම් කොමසාරිස් නඩුවේදී ස්ථාපිත අධිකරණ තීන්දුව මගින් මෙය පැහැදිලිව සනාථ වේ, එහිදී අධිකරණය තීන්දු කළේ පුද්ගලයෙකු ආයෝජනයක් ලෙස පමණක් තබා ගැනීමට නොව සංවර්ධන හා විකිණීමේ යෝජනා ක්‍රමයක් මගින් ලාභ ඉපැයීමේ අරමුණින් ඉඩමක් අත්පත් කර ගන්නේ නම්, එවැනි ක්‍රියාකාරකමක් වෙළඳාමකට සමාන වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ඕනෑම ලාභයක් ව්‍යාපාරික ආදායමක් ලෙස බදු අය කළ හැකි බවයි. රවීගේ නඩුවේදී, ඔහු මුලින් පුද්ගලික හේතුන් මත අක්කරයක ඉඩමක් මිලදී ගැනීමට ගිවිසුමකට එළඹුණද, පසුව ඔහු එම ඉඩම පර්චස් 10 ක කැබලි වලට බෙදා, තමාට කොටස් දෙකක් පමණක් රඳවා ගත් අතර, කෙටි කාලයක් තුළ ඉතිරි කොටස ප්‍රසිද්ධියේ විකුණා දැමීය.

මෙම සිදුවීම් අනුපිළිවෙලින් පෙන්නුම් කරන්නේ ඉඩම ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස තබා ගැනීම වෙනුවට ලාභ ඉපැයීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ පැහැදිලි අභිප්‍රායක් බවයි. ඉඩමක් කැබලි කිරීම සහ එයින් වැඩි කොටසක් ප්‍රසිද්ධියේ විකිණීමේ ක්‍රියාව යනු ව්‍යාපාරික උපාය මාර්ග යෙදීම සම්බන්ධ වාණිජ ක්‍රියාකාරකමක් වන අතර එය වෙළඳ ව්‍යවසායක ලක්ෂණ වලට සමාන ලක්ෂණ පිළිබිඹු කරයි.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව, එවැනි වෙළඳාමෙන් හෝ ව්‍යාපාර කටයුතුවලින් ලැබෙන ආදායම ආදායම් බද්දට යටත් වේ. එබැවින්, රවී විසින් උපයන ලද ලාභය හුදු ප්‍රාග්ධන ලාභයක් ලෙස නොව බදු අය කළ හැකි ව්‍යාපාර ආදායමක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එය ආදායම් බද්දට යටත් වේ. ***(ලකුණු 05)***

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

***පරිච්ඡේදය 06 - අත්තිකාරම් ආදායම් බද්ද, රඳවා ගැනීමේ බද්ද, සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද***

(a)

| | | |
|---|---|---|
| ලද ප්‍රතිෂ්ඨාව | | 90,000,000 |
| (-) ඉඩමේ පිරිවැය | | |
| අත්පත් කර ගැනීමේ පිරිවැය (100,000*500) | 50,000,000 | |
| තක්සේරු වාර්තා පිරිවැය | 500,000 | (50,500,000) |
| **ප්‍රාග්ධන ලාභය** | | **39,500,000** |
| ප්‍රාග්ධන ලාභ බද්ද @30% | | 11,850,000 |

***(ලකුණු 02)***

**(b)**

| ආදායම් වර්ගය | AIT/WHT අනුපාත | වගකීම (රු.) |
|---|---|---|
| නීති උපදේශ | 5% | 200,000 x 5% = **10,000** |
| කුලිය | 10% | 250,000,000 x 10% = **25,000** |

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 05)***

SRI LANKA

***A කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 30)

**B කොටස**

## පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 07 - වෙනත් ව්‍යාපාර බදු

**සීමාසහිත Dhana (පෞද්ගලික) සමාගම**
**එකතු කළ අගය මත බදු වගකීම ගණනය කිරීම**
**2025 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා**

| නිමැවුම් බද්ද | සැපයුම් වටිනාකම | බදු අනුපාත % | එකතු කළ අගය මත බද්ද |
|---|---|---|---|
| අපනයන විකුණුම් | 6,764,000 | 0% | - |
| දේශීය විකුණුම් - සරල කරන ලද එකතු කළ අගය මත බදු | 17,662,000 | 18% | 3,179,160 |
| අනෙකුත් දේශීය විකුණුම් | 25,450,000 | 18% | 4,581,000 |
| මුළු නිමැවුම් බද්ද | | | 7,760,160 |
| යෙදවුම් බද්ද | | | |
| අමුද්‍රව්‍ය ආනයනය කිරීම මත | | 1,100,000 | |
| දේශීය මිලදී ගැනීම් මත | | 1,127,000 | |
| කාර්යාල වියදම් මත | | 173,000 | |
| හිමිකම් කිව හැකි යෙදවුම් බද්ද | | **2,400,000** | |
| ඉදිරියට ගෙන එන ලද අවශෝෂණය නොකළ යෙදවුම් බද්ද | | 25,540 | |
| **මුළු හිමිකම් කිව හැකි යෙදවුම් බද්ද** | | | **(2,425,540)** |
| **ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද** | | | **5,334,620** |
| **අඩු කළා:** | | | |
| මාසික වාරික ගෙවීම් | | (500,000) | |
| සරල කරන ලද එකතු කළ අගය මත බදු බැර වවුචරපත් | | (3,179,160) | (3,679,160) |
| **ගෙවිය යුතු ඉතිරි එකතු කළ අගය මත බද්ද** | | | **1,655,460** |

*(ලකුණු 10)*

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 04 විවිධ ව්‍යාපාර සඳහා බදුකරණය

| **Home from Heaven** හවුල් ව්‍යාපාරය | | | |
|---|---|---|---|
| 2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම ගණනය කිරීම (රු.) | | | |
| | **සටහන්** | **(+)** | **(-)** |
| බදු පෙර ශුද්ධ ලාභය | | 43,829,500 | |

| | | | |
|---|---|---|---|
| විදේශ මුදල් බැංකු ඒකක (FCBU) තැන්පතු මත ලැබුණු පොලී ආදායම | | | 575,000 |
| භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළිය | | | 922,500 |
| **<u>හවුල්කරුවන්ට ගෙවන ලද වැටුප් - ඉඩ නොදේ</u>** | | | |
| - ජේන් | | 4,200,000 | |
| - ජැක් | | 3,600,000 | |
| පරිත්‍යාගය - ඉඩ නොදේ 11 වන වගන්තිය | | 750,000 | |
| ජේන්ගේ දියණිය | | ඉඩ දේ | |
| | | **52,379,500** | **1,497,500** |
| **හවුල් ව්‍යාපාර ආදායම** | | **50,882,000** | |
| එකතු කළා: ආයෝජන ආදායම | | | |
| විදේශ මුදල් බැංකු ඒකක (FCBU) තැන්පතු මත ලද පොලී ආදායම | | නිදහස් | |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | | 922,500 | |
| හවුල් ව්‍යාපාරයේ තක්සේරු කළ හැකි ආදායම | | **51,804,500** | |
| **<u>අඩු කළා: සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන: 52 වගන්තිය</u>** | | | |
| අනුමත පුණ්‍යායතනයකට කරන ලද මුදල් පරිත්‍යාගය | සටහන් 1 | (500,000) | |
| හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම | | **51,304,500** | |
| **<u>ගෙවිය යුතු බදු වගකීම ගණනය කිරීම</u>** | | | |
| පළමු 1,000,000 @ 0% | | | - |
| ශේෂය මත 50,304,500 @ 6% | | | 3,018,270 |
| **<u>ගෙවිය යුතු දළ බද්ද</u>** | | | **3,018,270** |

**සටහන් 01**

| | |
|---|---|
| අඩු අගය, | |
| සත්‍ය මුදල් පරිත්‍යාගය | 750,000 |
| උපරිම සීමාව | 500,000 |
| 1/5 x බදු අය කළ හැකි ආදායම | 10,360,900 |
| **අඩු අගය** | **500,000** |

***(මුළු ලකුණු 10)***

## *හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 05 - බැඳීම් සහ ක්‍රියාපටිපාටි |
|---|

**(A)** (a)

**තෙවැනි වාරිකය** = [ **2024/25 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු වගකීම** - **(ගෙවන ලද වාරික සහ ගෙවන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද)** ] / **ඉතිරි වාරිකය**

= [32,500,000 – (12,000,000 +115,000)] /2
= Rs. 10,192,500

***(ලකුණු 03)***

(b) තෙවන වාරිකය 2025 පෙබරවාරි 15 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

***(ලකුණු 01)***

***(B)***

(a)

- බදු ගෙවන්නාගේ නම
- බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (ඔiහ)
- දැන්වීම නිකුත් කළ දිනය
- එම මුදල් ගෙවීම සඳහා ඉල්ලීමක්
- පැහැර හරින ලද බදු ප්‍රමාණය
- බදු පැහැර හැරීම සඳහා අදාළ වන දඩය
- බදු වර්ගය
- අදාළ බදු කාල සීමාවන්
  - එම මුදල් ගෙවීමේ ස්ථානය

***(ලකුණු 02)***

(b)

| නිර්ණායක | දඩය |
|---|---|
| නියමිත දින සිට දින 14ක් ඇතුළත බදු වාරිකය සම්පූර්ණයෙන් හෝ කොටසක් ගෙවීමට අපොහොසත් වීම - 179(2) වගන්තිය | ගෙවිය යුතු බද්දෙන් 10% (නමුත් ගෙවා නැත) |
| බදු කාල සීමාවක් සඳහා ගෙවිය යුතු බදු ගෙවීමට අපොහොසත් වීම; නියමිත දින සිට දින 14ක් ඇතුළත හෝ තක්සේරු දැන්වීම අනුව නියමිත දිනට පෙර - 179(1) වගන්තිය | ගෙවිය යුතු බද්දෙන් 20% (නමුත් ගෙවා නැත) |
| නොසැලකිලිමත් හෝ වංචනික අඩු ගෙවීම් සඳහා (සිතාමතා හෝ නොසැලකිල්ල මත) - 180 දා වගන්තිය) | ගෙවිය යුතු බද්දෙන් 20% ක් රු. මිලියන 10 ට වඩා වැඩිනම් හෝ (දාදා) කාල සීමාව සඳහා පුද්ගල වගකීමෙන් 25% ට වඩා වැඩි නම්, දඩය ඌන ගෙවීමෙන් 75% ක් වනු ඇත. වෙනත් අවස්ථාවල දී, ඌන ගෙවීමෙන් 25% කි. |

***(ලකුණු 02)***

**(c)**

- රජයට ලැබිය යුතු යැයි සැලකෙන බොල් ණය ලෙස කපා හැරීම
- අධිකරණ ක්‍රියාමාර්ග
- බදු ගෙවන්නාගේ දේපළවලට එරෙහිව ක්‍රියාත්මක කිරීම
- අත්පත් කරගත් දේපළ විකිණීම
- රජයේ ගෙවීම්වලට එරෙහිව හිලව් කිරීම
- විදේශ සංචාරවලට එරෙහිව පනවන ලද සීමාවන්
- තෙවන පාර්ශවීය ණය ගැතියන්ගෙන් අයකර ගැනීම

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

\

***B* කොටසෙහි අවසානය**

(මුළු ලකුණු 50)

C කොටස

# අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 03 - සමාගම් සඳහා බදුකරණය**

**සීමාසහිත හරිත ප්ලාන්ටේෂන් සමාගම**
**ආදායම් බදු වගකීම ගණනය කිරීම**
**2024/25 තක්සේරු වර්ෂය සඳහා** (රු.)

| | | |
|---|---|---|
| ව්‍යාපාර ආදායම (සටහන 01) | | 102,186,750 |
| ආයෝජන ආදායම: | | |
| පොළී ආදායම - ස්ථාවර තැන්පතු | 15,540,000 | |
| කුලී ආදායම | 5,600,000 | |
| මුළු ආයෝජන ආදායම | | 21,140,000 |
| **මුළු තක්සේරු කළ හැකි ආදායම** | | **123,326,750** |
| අඩු කළා: සුදුසුකම් ලත් ගෙවීම් සහ සහන | | - |
| අනුමත පුණ්‍යායතනයකට භාණ්ඩ පරිත්‍යාග කිරීම - සුදුසුකම් ලත් ගෙවීමක් නොවේ. | | - |
| **බදු අය කළ හැකි ආදායම** | | **123,326,750** |
| 30% ක බදු වගකීම | | 36,998,025 |
| අඩු කළා: බදු බැර: | | |
| ගෙවූ වාරික | | (15,600,000) |
| ස්ථාවර තැන්පතු පොළී මත රඳවා ගැනීමේ බදු | | (777,000) |
| කුලිය සඳහා AIT | | (560,000) |
| **ගෙවිය යුතු ඉතිරි ආදායම් බදු** | | **20,061,025** |

**සටහන 01 - ව්‍යාපාර ආදායම ගණනය කිරීම**

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| | + | - |
| බදු පෙර ශුද්ධ ලාභය | 121,010,000 | |
| අඩු කළා: ආයෝජන ආදායම | | |
| ස්ථාවර තැන්පතු වලින් ලද පොළී ආදායම - ආයෝජන ආදායම - වෙනම බද්දට යටත් වේ. | | 15,540,000 |
| කුලී ආදායම - ආයෝජන ආදායම - වෙනම බද්දට යටත් වේ. | | 5,600,000 |
| ඉඩම් විකිනීමෙන් ලද ගිණුම්කරණ ලාභය | | 10,100,000 |
| **එකතු කිරීම / අඩු කිරීම** | | |
| ගිණුම්කරණ ක්ෂයවීම් | 8,210,000 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 1,940,000 | |
| සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රමාද ගෙවීම් මත දඩ | 64,000 | |
| සභාපතිගේ නිවසට ගෙවූ කුලිය | 525,000 | |

| | | |
|---|---|---|
| බොල් ණය කපා හැරීම - වෙළඳ ණය ඉඩ දෙනු ලැබේ | - | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 136,000 | |
| විදේශ ගමන් - ආදායම් ජනනය කිරීම සඳහා දරනු නොලැබේ | 800,000 | |
| පරිත්‍යාගය | 300,000 | |
| **ප්‍රාග්ධන දීමනාව** | | |
| **වසර තුළ එකතු කිරීම්** | | |
| ට්‍රැක්ටර් - අවුරුදු 5 ට වැඩි 3,000,000 | | 600,000 |
| ගෘහ භාණ්ඩ - සභාපති නිවසේ - ඉඩ නොදේ. | | - |
| ගෘහ භාණ්ඩ - කාර්යාලය - අවුරුදු 5 ට වැඩි 4,000,000 | | 800,000 |
| පෙර වසර | | |
| ඉඩම - හිමිකම් නැත | | - |
| කාර්යාල සහ ගබඩා ගොඩනැගිල්ල (අවුරුදු 20 ට වැඩි) 50,125,000 | | 2,506,250 |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් (අවුරුදු 5 ට වැඩි) 22,890,000 | | 4,578,000 |
| මෝටර් රථ - ජීප් රථය සඳහා හිමිකම් නැත | | - |
| වෙනත් මෝටර් රථ (අවුරුදු 5 ට වැඩි) 5,870,000 (මිලියන 13,870,000-8) | | 1,174,000 |
| **ඉඩම් විකිණීම මත ලාභයඃ** | | |
| ප්‍රතිෂ්ඨාව 38,100,000 | | |
| අඩු කළාඃ පිරිවැය (28,000,000) | | |
| විකිණීම මත බදු ලාභය | 10,100,000 | |
| | 143,085,000 | 40,898,250 |
| **මුළු ව්‍යාපාර ආදායම** | | **102,186,750** |

***(මුළු ලකුණු 25)***

aat SRI LANKA

## නවවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 03 - පුද්ගලයින්ගේ සහ සමාගම් සඳහා බදුකරණය**

**සුනිල් මහතා**

2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම ගණනය කිරීම (රු.)

| | | | |
|---|---|---|---|
| **සේවා නියුක්ත ආදායම** | | | |
| දළ වැටුප | 400,000*12 | | 4,800,000 |
| ගමන් ප්‍රතිලාභ (ඉන්ධන සහිත මෝටර් රථය) | (20,000+20,000) *12 | | 480,000 |
| කුලී දීමනාව | 400,000*12.5%*12 | 600,000 | |
| සේවකයාගේ පිරිවැය | 250,000*12 | 3,000,000 | |
| | අඩු අගය | | 600,000 |
| විදේශ සංචාර | බද්දට යටත් නොවේ | | |
| වෛද්‍ය බිල්පත් | බද්දට යටත් නොවේ | | |
| දුරකථන බිල්පත් | (780,000*50%) | | 39,000 |
| මුළු රැකියා ආදායම | | | **5,919,000** |
| ආයෝජන ආදායම | | | |
| පොළී ආදායම | භාණ්ඩාගාර බිල්පත් | | 57,000 |
| | ස්ථාවර තැන්පතු | 228,000*100 | 240,000 |
| ලාභාංශ ආදායම | අවසාන රඳවා ගැනීමේ බදු | 95 | - |
| මිලදී ගත් කොටස් විකිණීමෙන් ලැබෙන ලාභය | බද්දෙන් නිදහස් | | - |
| කුලී ආදායම | 100,000*12 | | 1,200,000 |
| **ආයෝජන ආදායම** | | | **1,497,000** |
| **තක්සේරු කළ හැකි ආදායම** | | | **7,416,000** |
| **අඩු කළා - සුදුසුකම් ලත් ගෙවීම්:** | | | |
| ගංවතුරෙන් විපතට පත් වූවන්ට පරිත්‍යාග | හිමිකම් නැත | | - |
| වැඩිහිටි නිවාස සඳහා පරිත්‍යාග - මුදල් | **රු.**75,000/- හෝ බදු අය කල හැකි ආදායමෙන් 1/3, අඩු අගය | | (75,000) |
| **සහන** | | | |
| පුද්ගලික සහන | | 1,200,000 | |
| කුලී සහන⋆ | දළ කුලියෙන් 25% | 300,000 | (1,500,000) |
| බදු අය කළ හැකි ආදායම | | | **5,841,000** |
| **බදු වගකීම:** | | | |
| පළමුව | 500,000 | 6% | 30,000 |
| ඊළඟ | 500,000 | 12% | 60,000 |
| ඊළඟ | 500,000 | 18% | 90,000 |
| ඊළඟ | 500,000 | 24% | 120,000 |

aat SRI LANKA

| | | | |
|---|---|---|---|
| ඊළඟ | 500,000 | 30% | 150,000 |
| ඊළඟ | 3,341,000 | 36% | 1,202,760 |
| **දළ බදු වගකීම** | **5,891,000** | | **1,652,760** |
| **අඩු කළා: බදු බැර** | | | |
| වාරික ගෙවීම් | | | (300,000) |
| අඩු කරන ලද APIT | | | (1,248,840) |
| පොළිය මත AIT | | | (12,000) |
| **ගෙවිය යුතු ඉතිරි බදු** | | | **91,920** |

***(මුළු ලකුණු 25)***

**C කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*